# පූර්ව නූතන ජපානයේ උකියො-එ කලාව

අසිත අමරකෝන්

The socio-political and economic situation of the Momoyama period to that of Edo period has contributed greatly in shaping the culture of pre-modern Japan. Apparently, the merchant class despite being the lowest of the social hierarchy became the ultimate benefactors of the particular economic growth of the urban centers such as Edo, Kyoto, and saka. The wealth and the hedonistic lifestyle of the merchant class (Chnin) known as the "Floating World" (Ukiyo), separated them from the traditional society and confined the traditional social order to a titular existence. These changes in the social context have dramatically affected the standards of taste and aesthetics, thus creating an entirely different trend based on the Kabuki theatre and the pleasure districts developed in urban centers. Woodblock prints and paintings of this "Floating World" has become the central artistic outcome of this culture and later flourished into a unique genre of art.

© අසිත අමරකෝන්

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

ජපානයේ මොමොයම අවධියේ සිට එදො අවධියේ අවසානය දක්වා වූ වසර තුන් සියයක පමණ කාල පරාසයේ පැවැති දේශපාලනික, සාමාජීය හා ආර්ථික පසුබිම ජපානය හා එහි සංස්කෘතිය හැඩගැස්වීම කෙරෙහි මහත් වූ දායකත්වයක් දක්වා ඇත. මේ අවධියේ පැවැති රදලවාදී අර්ථ ක්‍රමය හා වැඩවසම් සමාජ ස්තරායනය නාමික පැවැත්මකට සීමා කරමින්, නාගරීකරණයත් සමඟ බිහි වූ නව වෙළෙඳ පංතිය ක්‍රමයෙන් ඉහළට නැඟීමත් සමඟ සාම්ප්‍රදායික සෞන්දර්යාත්මක පරිකල්පනය හා රසඥතාව මෙන් ම කලාව හා එහි සමාජ භාවිතය ද විවිධ අයුරින් වෙනස්වීම්වලට ලක් විය. මේ සමාජ දේශපාලන වෙනස්කම් හා මේ වෙනස් වීම් හේතුවෙන් එදො අවධියේ දී පැනනැඟි උකියො-එ අච්චු මුද්‍රණය ජනප්‍රිය කලා අංගයක් ලෙස ප්‍රචලිත වීම හා එකල පැවැති සමාජ, දේශපාලනික හා ආර්ථික පසුබිම උකියො-එ සඳහා තේමා වී ඇති ආකාරය විමසා බැලීම මේ ලිපියෙහි අරමුණ යි.

ජපානයේ පූර්ව නූතන අවධිය ලෙස සැලැකෙන්නේ 1568 දී ඔද නොබුනග (Oda Nobunaga) අධිරාජයා ක්යෝතො (Kyoto) නගරය අත් පත් කරගත් අවස්ථාවේ සිට 1868 දී සිදු වූ මෙයිජි ප්‍රතිෂ්ඨාපනය (Meiji Restoration) දක්වා වූ වසර තුන් සියයක පමණ කාල පරිච්ඡේදය යි.[1] මීට පෙර පැවැති මුරොමචි (Muromachi 1392-1568) අවධියේ අවසාන කාලයේ පැවැති වසර 100ක පමණ යුද අවධිය (Warring states / Sengoku) නිමා කළ ඔද නොබුනග හා තොයොතොමි හිදෙයොෂි (Toyotomi Hideyoshi) ජපානයෙහි දේශපාලන ස්ථාවරත්වය හා සාමය ඇති කිරීමට උත්සාහ කළ හ. 1603 දී තොකුගව ඉඑයසු (Tokugawa Ieyasu) විසින් තොකුගව ෂෝගුන් (Tokugawa Shogunate) පාලනය ආරම්භ කරන ලදි. තොකුගව ආධිපත්‍යය 1868 දක්වා පැවැති අතර හේ ජපානයෙහි සාමකාමී වාතාවරණයක් පවත්වාගැනීමට සමත් විය. තොකුගව පාලනය යටතේ ජපානය බාහිර ලෝකයෙන් වෙන් කර හුදෙකලා ව තබාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කෙරිණි.

තොකුගව හෙවත් එදො (Edo) අවධියේ ක්‍රියාත්මක වූ පාලන තන්ත්‍රය මෙන් ම ආර්ථිකය හා සමාජ ක්‍රමය ද යුරෝපීය වැඩවසම්

ක්‍රමයට බොහෝ සෙයින් සමාන විය. ජපානයෙහි යුරෝපීය වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ ස්ථාපනය වූයේ කමකුර ෂෝගුන් (Kamakura Shogunatae) අවධියේ ය. ජපානයේ කඳු සහිත භූ පිහිටීම හේතුවෙන් භූමිය කුඩා ප්‍රදේශවලට වෙන් ව පැවැති අතර කඳුකර භූමිය නිසා ක්‍රමවත් මාර්ග සකස් කරගැනීම දුෂ්කර වීම වැනි භූගෝලීය සාධක වැඩවසම් සමාජ ක්‍රමයක් බිහි වීමට හා වර්ධනය වීමට ඉවහල් විය.

තොකුගව අවධිය පුරා පැවැති සමාජ ක්‍රමයේ විවිධ සමාජ පංති ස්තරායනය වූ පිළිවෙළ අනුව වඩාත් ම බලවත් වූයේ ෂෝගුන් ය. ෂෝගුන් යුද පාලකයා වූ අතර ෂෝගුන් පත් කරනු ලැබුවේ අධිරාජයා විසින් ය. අධිරාජයා සමාජ ස්තරායනයේ ඉහළින් ම සිටිය ද ඔහුගේ නිලය පැවැතියේ නාමික ව පමණි. සියලු දේශපාලනික බලතල දරන ලද්දේ ෂෝගුන් විසිනි. ෂෝගුන් යටතේ දයිම්යෝ (Daimyo) නම් ප්‍රදේශීය වංශාධිපතීහු කටයුතු කළ හ. තොකුගව ෂෝගුන් යටතේ දයිම්යෝ වංශාධිපතීහු 300ක් සිටිය හ. පාලන මධ්‍යස්ථානය වූ එදො ආසන්න ව පදිංචි ව සිටි ඉඩම් හිමි දයිම්යෝ වංශාධිපතීහු ෂෝගුන්ගේ පාලන කටයුතුවලට ක්‍රියාකාරී ව සහාය දැක්වූ හ. දූරස්ථ ප්‍රදේශවල වාසය කළ දයිම්යෝ වංශාධිපතීහු ෂෝගුන්ගේ පාලන කටයුතුවලට සම්බන්ධ නො වූ අතර ඇතැම් විට ෂෝගුන් පාලනයට ප්‍රතිවිරුද්ධ අදහස් දැරූ හ. එනමුත් ෂෝගුන් සිය උපායශීලී ක්‍රම මඟින් දයිම්යෝ වංශාධිපතීන් සිය අණසක යටතේ තබාගෙන සාමකාමී වාතාවරණයක් පවත්වා ගැනීමට සමත් විය.

හැම දයිම්යෝ වංශාධිපතියකු යටතේ ම පෞද්ගලික සමුරයි (Samurai) සේනාවක් විය. දයිම්යෝ වංශාධිපතීනට සේවය කළ සමුරයිවරු යුරෝපීය වැඩවසම් යුගයේ නයිට්වරුනට සමාන වූ හ. සාම්ප්‍රදායික ව සමුරයිවරු දයිම්යෝ වංශාධිපතීන්ගෙන් සහල් දීමනාවක් ලැබූ හ. ගොවියෝ වැඩවසම් ආර්ථිකයට සේවය සැපයූ වඩාත්ම ඵලදායී සමාජ පංතිය වූ හ. ගල් අඟුරු හා යකඩ නිධි නො තිබීම, දැව සම්පත සීමා සහිත වීම, බාහිර ලෝකය සමඟ වෙළෙඳ ගනුදෙනු නො පැවැත්වීම නිසා වැඩවසම් ජපානයේ ආර්ථිකය මූලික වශයෙන් සහල් මත රඳා පැවැතිණි.[2] එහෙත් ගොවීන්ගේ පෞද්ගලික ආර්ථික තත්ත්වය ඉතා ම පහළ මට්ටමක පැවැතිණි.

ඔවුන් ගොවිතැන් කළ ඉඩම හිමි දයිම්යෝ වංශාධිපතීනට සම්පූර්ණ අස්වැන්න ලබා දිය යුතු විය. දයිම්යෝ විසින් නැවැත ලබාදෙන ලද සහල් දීමනාවක් පමණක් ගොවියනට හිමි විය.

වැඩවසම් සමාජ ස්තරායනයේ පහළින් ම සිටියෝ ශිල්පීහු හා වෙළෙන්දෝ ය. තොකුගව අවධියේ දී ප්‍රචලිත වූ නව කොන්ෆියුසියානු දර්ශනවාදය (Neo - Confucianism) මඟින් සමාජයේ සිටි ඵලදායී සාමාජිකයනට වැදැගත් තැනක් හිමි විය.[3] මේ නිසා ගොවියනට සමාජීය වශයෙන් වෙළෙන්දන් හා අනෙකුත් ශිල්පීනට වඩා ඉහළ තැනක් හිමි විය. වෙළෙන්දන් හා ශිල්පීන් ආර්ථික වශයෙන් ගොවියනට වඩා ඉහළ මට්ටමක සිටිය ද සාම්ප්‍රදායික ඉඩම් හිමියන් ඇතුළු පාලකයෝ නිතර ම වෙළෙන්දන් සමාජීය වශයෙන් පහළ තලයකට සීමා කිරීමට උත්සාහ කළ හ. මේ සාම්ප්‍රදායික වැඩවසම් සමාජ ක්‍රමය හා ආර්ථික රටාව ක්‍රමයෙන් වෙනස් මඟකට යොමු වන ආකාරය තොකුගව අවධියේ දී දැකගත හැකි ය.

තොකුගව අවධියේ දී ජනගහණය හා නිෂ්පාදනය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පැවැති අතර නාගරික මධ්‍යස්ථාන ක්‍රමයෙන් වර්ධනය වන්නට විය. දහ සය වැනි සිය වස අග වන විට එදො, ඕසක, හා ක්යෝතො කේන්ද්‍ර කරගනිමින් නාගරීකරණය ව්‍යාප්ත විය. එමෙන් ම තොකුගව පාලනය යටතේ පැවැති වසර 250ක පමණ කාලය පුරා සාමකාමී වාතාවරණයක් පැවැතීම නිසා සමුරයිවරුන්ගේ සේවය අවශ්‍ය නො වී ය. මෙනිසා බොහෝ සමුරයිවරු නාගරික මධ්‍යස්ථාන ආශ්‍රිත ව ඉඩම් හිමියන් හා පාලකයන් ලෙස විවිධ අයුරින් ෂෝගුන් පාලන තන්ත්‍රයට එක් වූ හ. එදො ආශ්‍රිත ව ජීවත් වූ සමුරයිවරු පෙර රදල වංශාධිපතිනට දැක්වූ පක්ෂපාතීත්වය සෘජු ව ම ෂෝගුන් වෙත පළ කළ හ. එහෙත් ඇතැම් සමුරයිවරුනට මෙලෙස ස්ථාවර වීමට නො හැකි වූ අතර ඔවුහු ආර්ථික වශයෙන් ඉතා පහළ තත්ත්වයක සිටිය හ. එසේ වුව ද සමුරයිවරුන් කිසි විටෙක දියුණු වෙමින් පැවැති වෙළෙඳ ආර්ථිකයේ වෙළෙන්දන් ලෙස කටයුතු කිරීමට ඉදිරි පත් නො වූයේ සිය සමාජ තත්ත්වය රැකගැනීම සඳහා ය. නාගරික මධ්‍යස්ථාන ආශ්‍රිත ව වර්ධනය වූ වෙළෙඳ පංතිය ක්‍රමයෙන් ආර්ථික වශයෙන් ශක්තිමත් වන අතර දයිම්යෝ හා සමුරයිවරුනට වඩා බලවත් ව නැඟී සිටියේ ය. ආර්ථික වශයෙන්

ඉතා බලවත් වූ ඇතැම් වෙළෙන්දෝ දයිම්යෝ හා සමුරයිවරුනට මුදල් ණයට ලබා දුන් හ. ඇතැම් ධනවත් වෙළෙන්දෝ වෙළෙඳ සමාගම් පිහිටුවාගත් හ. මේ නාගරික වෙළෙඳ ප්‍රජාව චෝනින් (Chnin) ලෙසින් හැඳින්විණි. නාගරික ව ජීවත් වූ දයිම්යෝ වංශාධිපතීන්, සමුරයිවරු හා ගොවියන් හැරුණු විට අන් සියල්ලන් (විශේෂයෙන් වෙළෙඳ ජනයා) හැඳින්වීමට චෝනින් යන යෙදුම භාවිත වී ඇත.[4] චෝනින් යන යෙදුම 'තම පෞද්ගලික ලාභය අරමුණ කරගත් වෙළෙඳ ජනයා හා නගරාශ්‍රිත ශිල්පීන්' යන අදහසින් ද භාවිත වී ඇත. සියලු ම ශිල්පීහු, කඩ සාප්පු හිමියෝ, ඔවුන්ගේ ලිපිකරුවෝ හා අතවැසියෝ පමණක් නො ව තොග වෙළෙන්දෝ, තැරැව්කරුවෝ හා මුදල් ණයට දෙන්නෝ ද මේ පංතියට අයත් වූ හ.[5] ඔවුන් ආර්ථික වශයෙන් අන් අයට වඩා බලවත් වුව ද හැම විට ම සමාජ ස්තරායනයේ පහළින් ම සිටිය හ. මේ ධනවත් වෙළෙඳ පංතියේ සංඛ්‍යාත්මක වැඩි වීම නගරාශ්‍රිත ව නව සංස්කෘතික වටපිටාවක් නිර්මාණය කිරීමට සමත් විය.

දහ හත් වැනි සියවසේ අග හා දහ අට වැනි සියවසේ මුල් කාලයේ වර්ධනය වූ මේ නාගරික සංස්කෘතිය ගෙන්රොකු (Genroku) ලෙස හැඳින්වේ. එදොහි පස් වැනි ෂෝගුන් වූ තොකුගව ත්සුනයොෂගේ (Tokugawa Tsunayoshi 1680-1709) පාලන කාලයේ දී වර්ධනය වූ මේ සංස්කෘතික විපර්යාසයේ ප්‍රබලතම සාධකය වූයේ නව නාගරික වෙළෙඳ පංතියේ ආර්ථික සමෘද්ධිමත්භාවය යි.[6]

මේ අවධිය වන විට එදො සම්පූර්ණයෙන් ම ෂෝගුන් හා දයිම්යෝ ඇතුළු ඉහළ පංතියේ ප්‍රජාවගේ පාරිභෝගික මධ්‍යස්ථානයක් විය.[7] එදොහි නිෂ්පාදන කටයුතු සිදු වූයේ ඉතා අල්ප වශයෙනි. දෛනික අවශ්‍යතා සඳහා අවශ්‍ය භාණ්ඩ හෝ සුඛෝපභෝගී මෙවලම් හෝ මෙහි නිෂ්පාදනය නො වී ය. ක්යෝතොහා ඕසක ආශ්‍රිත කමිගත (Kamigata) කලාපයෙන් භාණ්ඩ ආනයනය කරන ලදි. මේ ආනයනික භාණ්ඩ අලෙවියෙන් එදො වෙළෙඳ ප්‍රජාව විශාල වශයෙන් ලාභ උපයාගත් හ. ගෙන්රොකු අවධියේ දී එදො වෙළෙඳ ශාඛා ඉසෙ (Ise), ඕමි (omi) හා වෙනත් පළාත්වල ද ව්‍යාප්ත ව පැවැතිණි. චෝනින් පංතිය අධික ලෙස ලාභ ලබමින්

ධනවත් වීම තොකුගව පාලනයට අභියෝගයක් විය. චෝනින් පංතිය වෙත ගලා ගිය ධන සම්භාරය පාලනය කිරීමටත් එමඟින් තම සමාජ ස්තරායනය පවත්වාගැනීමටත් තොකුගව පාලනය නිරන්තර ව උත්සාහ ගත් නමුත් ක්‍රමානුකූල අයබදු ක්‍රමයක් ගොඩනඟාගැනීමට අපොහොසත් විය. ආනයනික භාණ්ඩ වෙළෙඳාමෙන් නාගරික වෙළෙඳ පංතියේ නැඟීම ගෙන්රොකු සංස්කෘතිය සකස් වීමට පසුබිම සැකැසී ය.

ගෙන්රොකු අවධියේ දී ධනවත් චෝනින් ප්‍රජාව ශීඝ්‍ර ලෙස වර්ධනය වන්නට වූ හ. නාමික ව ඔවුන් අනෙකුත් සමාජ පංතිවලට වඩා පහළින් සිටි නිසා කොතරම් ධනවත් වුව ද සමාජ තත්ත්වය පෙන්නුම් කිරීමට ඔවුනට හැකියාවක් නො වී ය. අතීතයේ දී ජපානයේ සාමාන්‍ය වැසියනට සමාජයේ ඉහළ නිලවලට පත් වීමේ හැකියාවක් තිබුණි. එහෙත් එදො අවධියේ දී සමාජ තත්ත්වයෙන් ඉහළට යෑම කළ නො හැක්කක් විය. පැවැති සමාජ පංති බාධකය ඉවත් කිරීමට ඔවුනට නො හැකි වූ බැවින් සමාජ පංති භේදය වැදැගත් කොට නො සැලැකූ වෙනත් සංස්කෘතික ලෝකයක් ගොඩනඟා ගැනීමට ඔවුහු උත්සාහ කළෝ ය.

පංති භේදයෙන් ගැලවී යෑමේ මේ ක්‍රමය චෝනින් සමාජය පුරා ව්‍යාප්ත වී ක්‍රමයෙන් ගම්බද ප්‍රදේශ දක්වා ම පැතිරිණි. චෝනින්වරු ඔවුනට ම වෙන් වූ බලවත් සංස්කෘතික ප්‍රජාවක් ලෙස ඒකරාශි වූ හ. ඔවුනට ම වෙන් වූ මේ ලෝකයේ තම පහත් සමාජ තත්ත්වය නො සලකා හැරීමට ඔවුන්ට හැකි විය.[8] මේ වෙළෙඳ ප්‍රජාව වටිනා සළුපිළි, විසිතුරු බඳුන්, තේ බඳුන්, පොත්පත් ආදි සුඛෝපභෝගී භාණ්ඩ වෙනුවෙන් විශාල වශයෙන් ධනය වියදම් කළ හ. එදො අවධියේ සාහිත්‍යය ඇසුරින් බලවත් වෙළෙන්දන්ගේ අධික පරිභෝජනවාදී ජීවිත පිළිබඳවත් ඔවුන්ගේ සීමා රහිත ධනස්කන්ධය පිළිබඳවත් තොරතුරු හමු වේ.[9] ධනවතුනට තම සුඛෝපභෝගී රසවින්දනය සඳහා අවශ්‍ය ඕනෑ ම දෙයක් මිල දී ගැනීමේ හැකියාව තිබිණි. ඔවුන්ගේ විනෝදාස්වාදය පිණිස විවිධ සුඛෝපභෝගී සමාජ ක්‍රියාකාරකම්, ක්‍රීඩා, වෙනත් සංස්කෘතික අංග ද එදිනෙදා ජීවිතයේ අනිවාර්ය අංග බවට පත් විය.

චෝනින් ප්‍රජාවගේ මේ නාගරික ක්‍රියාකාරකම් බොහොමයක් තොකුගව පාලනය යටතේ පැවැති සමාජ ආචාර ධර්මවලට එකඟ නො වී ය. නව කොන්ෆියුසියානු දර්ශනයෙන් පෝෂණය වූ තොකුගව ෂෝගුන්ගේ පාලනය යටතේ සමාජ ආචාර ධර්මවලට වැඩි අවධානයක් යොමු වූ බැවින්[10] මේ නාගරික විනෝදාත්මක ක්‍රියාකාරකම්, විශේෂයෙන් ම ලිංගික කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් පාලනය කිරීමට තොකුගව ෂෝගුන් සීමා පැනැවී ය. ඒ අනුව ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන ආශ්‍රිත ව විනෝදාස්වාදය සඳහා වෙන ම ප්‍රදේශ (Pleasure Districts) වෙන් කරන ලදි. එදොහි යොෂිවර (Yoshiwara), ක්‍යෝතොහි ෂිමබර (Shimabara) හා ඕසකහි ෂින්මචි (Shinmachi) එලෙස වෙන් කරන ලද ප්‍රදේශ තුනකි.

මේ නාගරික ප්‍රජාව ගොඩනඟාගත් සුඛෝපභෝගී ජීවන රටාව උකියො (Ukiyo) හෙවත් පාවෙන ලෝකය (Floating World) යන නමින් හැඳින්විණි. උකියො යන සංකල්පය පූර්ව නූතන අවධියට පෙර සිට ම පැවැති බෞද්ධාගමික ඉගැන්වීම් පදනම් කරගත්තකි. එහි අදහස වූයේ මිනිසුන් ජීවත් වන ලෝකයේ අනියත අස්ථිර ස්වභාවය හා ඒ අස්ථිර ස්වභාවය නිසා ඇති වන දුක්ඛිත තත්ත්වය යි. බෞද්ධ ඉගැන්වීම් හා වත් පිළිවෙත් මඟින් මේ අස්ථිර ස්වභාවය ඉක්මවා යා යුතු බව සාම්ප්‍රදායික විශ්වාසය විය. එහෙත් එදො අවධියේ දී උකියො සංකල්පය නව අරුතකින් භාවිත විය.[11] මේ අල්ප කාලීන පාවෙන ලෝකය හා එහි සැප සම්පත්, එහි ඇති අනියත බව නිසා ම වඩා ආකර්ෂණය වූ අතර, ඒ සැප සම්පත් නැසී යෑමට පෙර විඳ ගත යුතු ය යන අදහස ඉස්මතු විය. ගෙන්රොකු සංස්කෘතියේ නගර වාසීන් මේ සුඛ විහරණය සඳහා නිරන්තරයෙන් ම ධනය වියදම් කළ අතර ඔවුන් සතු බලවත් ආර්ථික තත්ත්වය ප්‍රදර්ශනය කිරීමට ද එමඟින් අවස්ථාව ලැබිණි. ඔවුන්ගේ විනෝදාංශ අතර රංග ශාලාවලට, අභිසාරිකා ගෘහවලට විශේෂ තැනක් හිමි විය. ගෙන්රොකු සංස්කෘතියට විපක්ෂ මත දැක්වූ සාම්ප්‍රදායික වැසියෝ මේ ස්ථාන 'දුෂ්ට ස්ථාන' ලෙස හැඳින්වූ හ.[12] එහෙත් මේවා ගෙන්රොකු සමාජයේ වැදැගත් ආයතන දෙකක් විය. එදො අවධියේ ගෙන්රොකු සංස්කෘතියේ නිර්මාණ හා ඒවායේ තේමාව ගොඩනැඟී ඇත්තේ ප්‍රධාන වශයෙන් මේ සමාජ ආයතන හා ඒ හා සබැඳි ක්‍රියාකාරකම් ආශ්‍රයෙනි.

## ගෙන්රොකු සංස්කෘතිය හා කලාව

ගෙන්රොකු සංස්කෘතියේ නිර්මාණය වූ කලාව සම්පූර්ණයෙන් ම ජපානයේ සම කාලීන ලෞකික ජීවිතය පිළිබඳ පිළිබිඹුවක් විය. රදල පංතියේ අනුග්‍රාහකත්වයෙන් නො ව සාමාන්‍ය ජනතාවගේ ඉල්ලීම හා අනුග්‍රාහකත්වයෙන් කලා නිර්මාණ බිහිවන්නට විය. එමෙන් ම තාක්ෂණික වශයෙන් ක්‍රම ශිල්ප දියුණු වීම, අධ්‍යාපන මට්ටම ඉහළ යෑම හා අධික ධන සම්භාරය මෙන් ම සුඛෝපභෝගී ජීවන රටාව ගෙන්රොකු කලාව හැඩගැස්වීම කෙරෙහි බලපෑවේ ය.

උකියො හෙවත් පාවෙන ලෝකය හා එහි වැසියන් පදනම් කරගත් මේ කලා නිර්මාණ අතර උකියො-ශෝෂි (Ukiyo-Zoshi) හෙවත් පාවෙන ලෝකය ගැන ලියැවුණු ශෘංගාරාත්මක ප්‍රබන්ධ වැදැගත් වේ. උකියො ප්‍රබන්ධකරුවන් අතර ඉහර සයිකකු (Ihara Saikaku) පුරෝගාමියෙකි. චිකමත්සු මොන්සඑමොන්ගේ (Chikamatsu Monzaemon) සුප්‍රකට කබුකි නාට්‍ය ද මත්සුඔබෂෝගේ (Matsuo Basho) හයිකු කාව්‍ය ද කනෝ (Kano) හා තොස (Tosa) සිතුවම් සම්ප්‍රදාය යටතේ දියුණු වූ උකියො-එ සිතුවම්, ඔගත කෝරින්ගේ (Ogata Krin) සැරසිලි කලාව ද මේ අවධියේ වැදැගත් නිර්මාණ ය. මේ අවධියේ දී කලා අංගයක් ලෙස ප්‍රචලිත වූ සුවිශේෂ නිර්මාණ ලෙස උකියො-එ දැව අච්චු මුද්‍රණ (Woodblock Prints) හැඳින්විය හැකි ය.

## උකියො-එ (Ukiyo-e)

එදො අවධියේ දී ප්‍රචලිත වූ උකියො හෙවත් පාවෙන ලෝකය පිළිබඳ සංකල්පය සමඟ බිහි වූ උකියො-එ යනු පාවෙන ලෝකය නිරූපිත සිතුවම් ය. නාගරික සුඛෝපභෝගී ජීවන රටාව සබැඳි විනෝදාත්මක හා ශෘංගාරාත්මක තේමා නිරූපිත මේ සිතුවම් එවකට ජනප්‍රිය ව පැවැති කබුකි නාට්‍ය හා උකියො-ශෝෂි ප්‍රබන්ධ සමඟ සමීප ව නිර්මාණය වී ඇත. ක්යෝතො ආශ්‍රිත ව උකියො-එ සිතුවම් ලෙස නිර්මාණය වූ අතර එදො ආශ්‍රිත ව උකියො-එ දැව අච්චු මුද්‍රණය මඟින් නිර්මාණය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් අභිසාරිකාවන්, ගේෂා ළඳුන්, කබුකි නළුවන්, සුමො ක්‍රීඩකයන්, අභිසාරිකා ගෘහ ආශ්‍රිත ක්‍රියාකාරකම් ආදිය වස්තු විෂය වී ඇත.

උකියො-එ අච්චු මුද්‍රණ එදො ගෙන්රොකු සංස්කෘතියේ වාණිජ කලාවක් ලෙස ඉතා කෙටි කලකින් ජනප්‍රියත්වයට පත් විය. උකියො-ශෝෂි ප්‍රබන්ධ ඇතුළත් පොත් සඳහා සන්නිදර්ශන චිත්‍ර ලෙස නිර්මාණය වූ උකියො-එ අච්චු මුද්‍රණ චෝනින් ප්‍රජාව අතර ඉමහත් ජනප්‍රියත්වයක් ලද බැවින් පසු ව තනි කලා නිර්මාණ වශයෙන් ද නිර්මාණය විය.

කබුකි නාට්‍යවලින් වෛවර්ණ ලෙස ඉදිරි පත් කළ උකියො ජීවන අපේක්ෂා උකියො-එ මඟින් වාර්තාගත කෙරිණි. කබුකි නාට්‍යවල රඟ දැක්වූ චරිත හා ඒ නළුවන් මෙන් ම අභිසාරිකාවන් හා ගේෂා ළඳුන් කෙරෙහි චෝනින් ප්‍රජාව අතර පැවැති උද්‍යෝගය නිසා ම උකියො-එ ලෙස නිර්මාණය වූ ඔවුන්ගේ රූපවලට ඉමහත් ඉල්ලුමක් විය. මේ උකියො-එ මුද්‍රණ ප්‍රචාරණ කටයුතු සඳහා මෙන් ම සැමැරුම් ලෙස අලෙවි කිරීම සඳහා ද විශාල වශයෙන් නිපදවනු ලැබී ය. උකියො-එ මුද්‍රණ ශිල්පීන් වර්ධනය කරගත් නව ක්‍රමවේද මඟින් කෙටි කාලයකින් හා අඩු වියදමකින් පිටපත් රාශියක් මුද්‍රණය කළ හැකි වූ බැවින් මිලෙන් අඩු වූ මේ නිර්මාණ ඉතා ජනප්‍රිය විය.

උකියො-එ ශිල්පීන්ගේ සිතුවම් නිර්මාණ මුද්‍රණය සඳහා සකස් කිරීම හා වෙළෙඳ පොළ වෙත නිකුත් කිරීම සාමූහික ප්‍රයත්නයක් විය. ශිල්පියා සිතුවම සැලැසුම් කළ පසු එය දැව අච්චුවක් ලෙස කපා සකස් කරන ලද්දේ ඒ සඳහා පුහුණු වූ කැටයම්කරුවකු විසිනි. පසු ව ඒ අච්චුව මඟින් පිටපත් මුද්‍රණය කළේ දක්ෂ මුද්‍රණ ශිල්පියෙකි. ඉන්පසු මේ පිටපත් බෙදා හැරීම හා අලෙවිය මෙන් ම මූල්‍යමය කටයුතු ද පොත් ප්‍රකාශකයකු විසින් සිදු කරන ලදි.

උකියො-එ අච්චු මුද්‍රණ ක්‍රමයට නිර්මාණය කිරීමේ පුරෝගාමී ශිල්පියා ලෙස සැලැකෙන්නේ හිෂිකව මොරොනොබු (Hishikawa Moronobu 1618-1694) ය. ඔහු උකියො-එ ජනප්‍රිය කලා අංගයක් ලෙස ප්‍රචලිත කළ පළමු ශිල්පියා ලෙස ද සැලැකේ. අභිසාරිකාවන්, කබුකි නළුවන් නිරූපිත තේමා මෙන් ම ෂුන්ග (Shunga) යනුවෙන් හැඳින්වූ ශෘංගාරාත්මක නිර්මාණ ඔහුගේ තේමා අතර විය.

උකියො-ශෝෂි ප්‍රබන්ධ නවකතා සඳහා තනි පිටුවේ සන්නිදර්ශන පළමු වැනි වරට සැලැසුම් කරන ලද්දේ මොරොනොබු විසිනි. එසේ ම පාඨයක් රහිත මුද්‍රිත නිර්මාණය කිරීමෙන් මුද්‍රිත චිත්‍ර වෙන ම  කලා අංගයක් බවට පත් කළේ ද ඔහු ය. එමෙන් ම මුද්‍රිත චිත්‍රවල තම නම සඳහන් කරමින් ශිල්පියාගේ වැදැගත්කම ද ඔහු තහවුරු කළේ ය. මොරොනොබුගේ නිර්මාණ තනි වර්ණ නිර්මාණ විය. ඔහුගේ ඇතැම් මුද්‍රණ පසු ව අතින් වර්ණ ගන්වා ඇත. නිෂිකව සුකෙනොබු (Nishikawa Sukenobu) ද වැදැගත් උකියො-එ ශිල්පියකු ලෙස සැලැකේ. ඔහු ක්යෝතොහි වාසය කරමින් මුද්‍රණ නිර්මාණය කිරීම විශේෂත්වයකි. ඔහු ශෘංගාරාත්මක ලෙස කාන්තා රූප නිරූපණයට ප්‍රසිද්ධියක් ඉසිලී ය. ඔහු 1723 දී ප්‍රකාශයට පත් කළ වෙළුම් දෙකකින් යුත් ග්‍රන්ථයෙහි (Hyakunin joro shinasadame) අධිරාජිනියගේ සිට අභිසාරිකාව දක්වා විවිධ සමාජ තලවල කාන්තා රූප සියයක් විය.

ඔකුමුර මසනොබු (Okumura Masanobu 1686-1764) උකියො-එ මුද්‍රණ විවිධ අයුරින් වර්ණ ගැන්වීමට විවිධ අත්හදා බැලීම්වල යෙදුණ ශිල්පියෙකි. එමෙන් ම බටහිර ක්‍රමයේ රේඛීය පර්යාලෝකය භාවිතය ඔහුගේ නිර්මාණවල විශේෂ ලක්ෂණයකි.

උකියො-එ මුද්‍රණ සඳහා වඩා සංකීර්ණ වර්ණ රටා එක් කිරීමට සමත් වූයේ සුසුකි හරුනොබු (Suzuki Harunobu 1725 - 1770) නැමැති ශිල්පියා ය. ඔහු මුද්‍රණය සඳහා විවිධාකාර ශිල්ප ක්‍රම භාවිත කළ අතර ඔහුගේ ඇතැම් නිර්මාණ සඳහා එක් එක් වර්ණය වෙන වෙන ම අච්චු 12ක් දක්වා යොදාගෙන ඇත. ඔහුගේ බහු වර්ණ නිර්මාණ ජනප්‍රිය වීමත් සමග අතින් වර්ණ ගැන්වූ හා සීමා සහිත වර්ණ යෙදූ උකියො-එ නිර්මාණ සම්ප්‍රදායය පිරිහී ගියේ ය. හරුනොබු සම්භාව්‍ය කාව්‍ය නිර්මාණ මෙන් ම, සම කාලීන සුන්දර කාන්තාවන් ද වස්තු විෂය කරගත්තේ ය. එමෙන් ම අනෙකුත් බොහෝ උකියො-එ ශිල්පීන් මෙන් ශෘංගාරාත්මක ෂුංග සිතුවම් ද ඔහු නිර්මාණය කළේ ය. හරුනොබුගේ විශේෂත්වයක් වන්නේ කාන්තා රූප පරමාදර්ශී චරිත ලක්ෂණ සහිත ව නිරූපණය කිරීම යි.

කොරියුසයි (Korysai 1735-1790) හා කිතඔ ෂිගෙමස (Kitao Shigemasa 1739-1820) යන දෙ දෙනාගේ නිර්මාණ මඟින් උකියො-එ කලාව හරුනොබුගේ පරමාදර්ශී ලක්ෂණවලින් බැහැරට ගෙන යනු ලැබී ය. සම කාලීන සැබෑ ලෝකයේ නාගරික විලාසිතා, සුප්‍රසිද්ධ අභිසාරිකාවන් හා ගේෂා ළඳුන් නිරූපණය කිරීමට ඔවුන් උත්සාහ ගෙන ඇත.

18 වැනි සියවසේ අග භාගය වන විට උකියො-එ ගුණාත්මක මෙන් ම ප්‍රමාණාත්මක වශයෙන් ද වර්ධනය විය. තොරී කියොනග (Torii Kiyonaga 1752-1815) සුන්දර කාන්තාවන්, නාගරික දර්ශන මෙන් ම කබුකි නළුවන් ද තේමා කරගෙන ඇත. උතමරො (Utamaro 1753-1806) සුන්දර කාන්තා රූප හිස හා උඩු කය නිරූපණය වන පරිදි ප්‍රතිරූප ආකාරයෙන් නිර්මාණය කර ඇත.

උකියො-එ නිර්මාණකරුවන් අතර ෂරකු විශිෂ්ටතම ශිල්පියෙකි (Sharaku 1794-?). ඔහුගේ නිර්මාණ අතර කබුකි නළුවන්ගේ තාත්ත්වික ප්‍රතිරූපවලට සුවිශේෂ වැදගත්කමක් හිමි වේ.

එදො අවධියේ අවසාන කාලය වන විට උකියො-එ නිර්මාණ සඳහා ස්වාභාවික දර්ශන ආදිය ජනප්‍රිය තේමා බවට පත් විය. මේ තේමා නිරූපිත උකියො-එ නිර්මාණ අතර හොකුසයිගේ (Hokusai 1760-1849) නිර්මාණ ඉතා වැදගත් වේ. එයිසෙන් (Eisen), කුනියොෂි (Kuniyoshi) හා කුනිසද (Kunisada) මේ කාලයේ සිටි අනෙකුත් ස්වභාවික දර්ශන නිරූපණය කළ ශිල්පීන් ය. හිරොෂිගෙ (Hiroshige 1797-1858) පක්ෂි රූප හා මල් වර්ග මෙන් ම භූ දර්ශන නිර්මාණය කළ තවත් විශිෂ්ට ශිල්පියෙකි.

**සමාලෝචනය**

එදො අවධියේ දී ජපානයේ පැවැති දේශපාලන, සමාජ හා ආර්ථික පසුබිම එකල කලාවේ නිෂ්පාදනය මෙන් ම පරිභෝජනය කෙරෙහි විවිධ අයුරින් බල පා ඇති බව පෙනේ. දැඩි ලෙස ස්ථාපනය වී පැවැති වැඩවසම් සමාජ ක්‍රමය නාමික පැවැත්මකට සීමා කිරීමට

එකල පැවැති සාමකාමී වාතාවරණය මෙන් ම ආර්ථික සමෘද්ධිමත්භාවය ද ඉවහල් විය. කොන්ෆියුසියානු දර්ශනය පදනම් කරගත් ෂෝගුන් පාලන තන්ත්‍රය යටතේ පැවැති සමාජ ආචාර ධර්ම හා සීමා නොසැලකූ නැඟී එන වෙළෙඳ පංතිය තමනට ම වෙන් වූ නාගරික සංස්කෘතියක් ගොඩනඟාගැනීම මේ අවධියේ කලාව හා සෞන්දර්යවාදය නව මඟකට යොමු කිරීමට සමත් වී ඇත.

දහ සය වැනි සිය වස අග වන විට කලා රසාස්වාදය මෙන් ම කලාවට අනුග්‍රාහකත්වය දැක්වීම ද පාලකයනට හා වංශාධිපතිනට සීමා වූ වරප්‍රසාදයක් විය. මේ ඒකාධිකාරයට අභියෝග කරමින් එදො අවධියේ දී නැඟී ආ ධනවත් සාමාන්‍ය ජනයා විවිධ අයුරින් කලාව නිපදවීමට අනුග්‍රාහකත්වය දැක්වූ අතර සිය රසඥතාවය හා අවබෝධය අනුව කලාව පරිභෝජනය ඔස්සේ වැඩවසම් සමාජ ස්තරායනය ඉක්මවා ඉහළ සමාජ පංතිය හා සම වීමට උත්සාහ කළ හ. එදො අවධියේ දී නිෂ්පාදනය වූ උකියො-එ කලා නිර්මාණ මේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකි ය. සම කාලීන නාගරික සමාජ වටපිටාව තේමා කරගත් හුදු වාණිජ කලාවක් ලෙසින් පැන නැඟි නමුත් එදො අවදියේ අවසාන කාලය වන විට උකියො-එ කලාව ගුණාත්මක වශයෙන් වර්ධනය වී කලා සම්ප්‍රදායයක් ලෙස ඉස්මතු වන ආකාරය ද හඳුනාගත හැකි ය.

## ආන්තික සටහන්

[1] Totman, 1995
[2] Michener, 1983, pp. 12-13
[3] Craig, 2005, p. 472
[4] Frédéric, 2002, p. 121
[5] Hibbett, 2001, p. 4
[6] Frédéric, 2002, p. 239
[7] Nishiyama, 1997, p. 41
[8] Nishiyama, 1997, p. 204
[9] Hibbett, 2001, p.6
[10] Craig, 2005, p. 472
[11] Deal, 2006, p.295
[12] Hibbett, 2001, p.23

## මූලාශ්‍රය නාමාවලිය

Craig, E. (Ed.). (2005). **Shorter Routledge Encyclopedia of Philosophy**. Routledge.

Deal, W. E. (2006). **Handbook to life in medieval and early modern Japan**. New York NY: Facts On File, Inc.

Frédéric, L. (2002). **Japan encyclopedia**. Belknap Press of Harvard University Press.

Hibbett, H. (2001). **Floating World in Japanese Fiction**, Tuttle Publishing.

Michener, J. A. (1983). **The floating world**. University of Hawaii Press.

Nishiyama, M. (1997). **Edo culture: daily life and diversions in urban Japan**, 1600-1868. University of Hawaii Press.

Totman, C. D. (1995). **Early modern Japan**. Berkeley: University of California Press.